සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සිංහල භාෂා අංශය

සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023

(පාසල් මට්ටම)

---

## ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

කාලය පැ.01 මි.30යි.

I කොටසින් එකක් ද, IIකොටසේ (අ) යටතේ එකක් ද, (ආ) යටතේ එකක් ද, (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

### I කොටස

පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 350කට නො අඩු රචනයක් ලියන්න.

(අ) පවස නිවනා දිය බිඳේ සිට ආහාර-පාන, ඇඳුම්-පැළඳුම්, වාසස්ථාන, ඖෂධ පමණක් නොව සුන්දරත්වය ද ඍජුව හෝ වක්‍රව නොමසුරුව අප වෙත ලබා දෙන්නේ අප අවට පරිසරයයි. 'පරිසර අසිරියෙන් ජීවය ලබමු' යන මැයෙන් **රචනයක්** ලියන්න.

(ආ) නූතන ලෝකයේ රැකියා වෙළෙඳපොළ අවශ්‍යතාවන් සපුරාලන්නට සමත් විෂය ධාරාවන් පසුපස හඹායමින් දැනුම සොයනා වත්මන් ශ්‍රී ලාංකේය ශිෂ්‍ය පරපුරට ගීතයක් රසවිඳීමට පවා හැකියාවක් නොමැති වීම ජාතියේ අභාග්‍යසම්පන්න ඉරණමකි. භාෂා ශක්‍යතාවන් සේ ම සාහිත්‍ය රසඥතාව ද පරිපූර්ණ මිනිසෙකු බිහිකිරීමෙහිලා එකසේ වැදගත් වන බැවින්, 'සාහිත්‍ය රසඥතාවෙන් සුපෝෂිත අනාගත පරපුරක්' යන මැයෙන් **රචනයක්** ලියන්න.

(ඇ) නොමිලයේ ලැබෙන නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රයෝජනය ලැබූ උගත් වෘත්තිකයන්ගෙන් බහුතරය; ඉංජිනේරුවන්, ගණකාධිකාරීන්, විශේෂඥ වෛද්‍යවරුන් අද රට හැර යමින් සිටියි. ඔවුන් වෙනුවෙන් විය-පැහැදම් වී ඇත්තේ රටේ ජාතික ධනයයි. අද එහි ප්‍රතිලාභ ද රටට අහිමි වී තිබේ. 'වත්මන් ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය හමුවේ සංවර්ධන ඉලක්ක ජය ගැනීමට නම්' යන මැයෙන් **රචනයක්** ලියන්න.

(ඈ) රටක සරසවි වරම් ලබන්නේ එරට බුද්ධිමත් තරුණ පිරිසයි. රටේ අනාගත අභිවෘද්ධියට ඍජු දායකත්වයක් සැපයිය හැක්කේ ද එකී තරුණ පිරිසටය. නවකයන් සුහද ව පිළිගැනීම වෙනුවට මෙරට ශිෂ්ට සමාජය අනුමත නො කරන දරුණු හිංසාකාරී මානුෂීය පීඩාවක් බවට අද 'නවක වදය' පත්වී තිබීම නවක සිසුන්ගේ මෙන් ම දෙමාපියන්ගේ ද අපේක්ෂා භංගත්වයට හේතු වී තිබේ. 'නවක වදය පිටු දැකීමට නම්' යන මැයෙන් **රචනයක්** ලියන්න.

(ඉ) මෙරට ඇඟලුම් කර්මාන්තය දෙස විමසුම් ඇසින් බැලූ කල්හි අසරණ තරුණියන්ගේ නූගත්කම දුප්පත්කම දඩමීමා කරගෙන ශ්‍රමය සූරා කමින් සුළු පිරිසක් අධික ලාභ ලබන අයුරු දක්නට ලැබේ. එසේ ම ඇඟලුම් කර්මාන්තයෙහි නිරත කාන්තාවට ලැබෙන සමාජ පිළිගැනීම පවා සෑහීමකට පත්විය හැකි මට්ටමක නොවන බව දෘශ්‍යමානය. 'රටේ ආර්ථිකයට ශ්‍රම දායකත්වය සපයන වත්මන් කාන්තා පරපුර' යන මැයෙන් **රචනයක්** ලියන්න.

(ලකුණු 40යි)

## II කොටස

(අ) (I) ඔබ පාසලේ ඇති විද්‍යුත් සංනිවේදන උපකරණ පද්ධතිය කලක සිට අක්‍රීය ව පවතී. සංනිවේදන මාධ්‍ය ඒකකයේ ක්‍රියාකාරී සාමාජිකයකු වන ඔබට පසු ගිය දිනෙක විදුහල්පතිතුමා දන්වා සිටියේ ප්‍රසිද්ධ මැණික් ව්‍යාපාරික ප්‍රියන්ත දිසානායක මහතා නව සංනිවේදන උපකරණ කට්ටලයක් පාසලට පරිත්‍යාග කිරීමට කැමැත්ත පළ කළ බවයි. පාසලේ අවශ්‍යතාව එතුමාට දන්වන ලිපිය ලිවීමේ කාර්යය ඔබ වෙත පැවරී ඇති බැවින් විදුහල්පති මගින් යවන **ලිපිය** ලියන්න.

(II) ඔබේ පාසලේ සාහිත්‍ය සංගමය මගින් 2023 වර්ෂය සඳහා සැලසුම් කරන ලද 'සාහිත අඹරේ දිලෙන තරු' උත්සවය සඳහා මාධ්‍ය ආවරණයක් ලබා දෙමින් අනුග්‍රහය දක්වන ලෙස ස්වාධීන රූපවාහිණී සංස්ථාවේ සභාපති වෙත යවන **ලිපිය** ලියන්න. (ඔබ සාහිත්‍ය සංගමයේ ලේකම් යැයි සිතන්න.)

(ලකුණු 20යි)

(ආ) (I) වත්මන් සමාජගත ආර්ථික පීඩනය හමුවේ ශිෂ්‍ය සුබ සාධන වැඩසටහනක් ලෙස සිසුන් 150කට පසුගිය දා පාසල් උපකරණ බෙදා දීමක් ඔබ පාසලේ දී සිදු විය. ප්‍රදේශයේ අනුග්‍රාහක හවතුන් කිහිප දෙනෙකුගේ දායකත්වය ඒ සඳහා ලැබුණු අතර ප්‍රාදේශීය ප්‍රවෘත්ති වාර්තාකරු ඔබ යැයි සිතා උක්ත අවස්ථාව විස්තර කරමින් **පුවත්පත් වාර්තාවක්** ලියන්න.

(II) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් උසස් පෙළ ලියූ දරුවන් වෙනුවෙන් නොමිලයේ ලබා දීමට සැලසුම් කර ඇති පරිගණක පාඨමාලාවකට අයදුම්පත් කැඳවා ඇත. ඒ සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන ඔබ ඊට සුදුසු **අයදුම්පත** සකස් කරන්න.

(ලකුණු 20යි)

(ඉ) (I) ඔබ පාසලේ බෞද්ධ සංගමය මගින් එළඹෙන වෙසක් පොහොය දිනට සංවිධානය කර තිබෙන වෙසක් බැති ගී සංදර්ශනය නැරඹීමට පැමිණෙන ලෙස දෙමාපියන් ඇතුළු ප්‍රදේශවාසීන් දැනුම්වත් කෙරෙන **පෝස්ටරයක්** නිර්මාණය කරන්න.

(II) කසළ කලමනාකරණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමේ භාරදූර කාර්යය ඔබ වෙත පැවරී ඇත. ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ඔබ යැයි සිතා ජනතාව දැනුම්වත් කිරීමට බෙදා දෙන **අත් පත්‍රිකාව** සකස් කරන්න.

(ලකුණු 20යි)